**01.** ගාථාව

" දීඝා ජාගරතෝ රත්ති - දීඝං සන්තස්ස යෝජනං,
දීඝෝ බාලානං සංසාරෝ - සද්ධම්මං අවිජානතං"

පදගතාර්ථය

| | |
|---|---|
| **ජාගරතෝ** | - නො නිදන්නාට |
| **රත්ති** | - රාත්‍රිය |
| **දීඝං** | - දිග ය. |
| **සන්තස්ස** | - ගමන්-විඩා ඇත්තහුට |
| **යෝජනං** | - යොදුන |
| **දීඝං** | - දිග ය. |
| **සද්ධම්මං** | - සදහම් |
| **අවිජානතං** | - නො දන්නා වූ |
| **බාලානං** | - බාලයන්ට |
| **සංසාරෝ** | - සංසාරය |
| **දීඝං** | - දිග ය. |

භාවාර්ථය

නො නිදන්නාට රාත්‍රිය දිග ය. ගමන්-විඩා ඇත්තහුට යොදුන දිග ය. සදහම් නො දත් අඥනයාට (බාලයාට) සසර දිග ය.

නිදන-කථාව

සැවැත් නුවර පසේනදි කොසොල් රජතුමා එක්තරා උත්සව දිනෙක ඇත්-අබරණින් සැරසුණු පුණ්ඩරික නම් සුදු ඇතු පිට නැඟී මහපෙරහැරින් නුවර පැදකුණු කරන කල්හි රජු දක්නා වූ මිනිස්සු "රජු දුන් දනෙහි විපාකය බලවු! රජු විසින් සසර දී රක්නා ලද සීලයේ ආනුභාවය පුදුම ය. කරන ලද යහපත් කටයුතුවල ඵලය පෙනේ ද"යි කියන්නට වූහ.

නුවර පැදකුණු කරන රජු, සිය නිවසෙහි උඩුමහලේ සිට පෙරහැර බලන්නා වූ රූමත් ස්ත්‍රියක දැක ඈ කෙරෙහි පිළිබඳ සිත් ඇති ව මිත්‍ර-ඇමතියෙකු අතින් ඈ පිළිබඳ ව කරුණු විචාරා ඇය සස්වාමික බව දැන ඇගේ හිමියා උපායකින් මරා අඹුව ගනිමි'යි සිතා ඔහු ගෙන්වා "මාලිගාවෙහි සිට මෙහි කටයුතු සොයා බලව"යි අණ කොට කඩුවක් හා පලිහක් දුන්නේ ය.

මරණ බියෙන් බියපත් වූ හේ මැනැවින් රජුට සේවය කළේ ය. කාමගින්න බුර බුරා නඟිත් ම ඔහුගේ වරදක් නො දුටු රජ තෙමේ වරදක් නගා මරා දමන්නෙමි'යි සිතා ඔහු ළඟට ගෙන්වා, "මෙයින් සියක් යොදුනක් පමණ ගිය තැන ගඟක් ඇත. එහි කඩුපුල් මල් හා අරුණුවන් මැටි තිබේ. එහෙයින් එහි ගොස් මා නාන වේලාවට කඩුපුල් මල් හා අරුණුවන් මැටි ටිකක් ගෙන එව. නො ගෙනාවොත් දඬුවම් කරන්නෙමි'යි දැන්වීය.

ඒ පුරුෂ තෙමේ ද "කඩුපුල් හා අරුණුවන් මැටි තිබෙන්නේ නාගභවනෙහි ය. මම එය කෙසේ ලබම් ද'යි සිතා මරණ බියෙන් තැති ගෙන ගෙට ගොස් බිරියගෙන් බත් හා මාළුවකුත් පෙට්ටියක ලවා හැරගෙන ගෙයින් නික්ම යොදුනක් පමණ ගොස් බත්මුල ලිහා ඉඳුල් නො කොට බත් කොටසක් වෙන් කර කන්නට පටන් ගත්තේ ය. ඒ අතර පාරේ යන මඟියෙකු දැක "මෙහි එන්න. මේ බත් කා යන්නැ"යි පසෙක තබා තිබුණු බත් මඟියාට දුන්නේ ය. තමා ද බත් කා මිටක් පමණ ඉතිරි කොට එය දියට දමා හඬ ගා "මේ ගඟෙහි වසන නාගයෙනි, දෙවියනි! මම මඟියෙකුටත් බත් දුනිමි. කුඩමස්සන්ටත් බත් දුනිමි. ඒ පින් අනුමෝදන් ව මට කඩුපුල් මල් හා අරුණුවන් මැටි ගෙනවුත් දුන මැනවැ"යි කීයේ ය.

ඒ ගඟ පත්ලේ වසන නා රජ තෙමේ ඒ අසා මහලු මිනිස්වෙසකින් අවුත් තුන්-විටක් ම 'පින් දෙව'යි කියා පින් ලැබ කඩුපුල් මල් හා අරුණුවන් මැටි ගෙනවුත් දුන්නේ ය.

රජ තෙමේ "මිනිස්සු නම් බොහෝ උපාය දනිති. යම්හෙයකින් කඩුපුල් මල් හා අරුණුවන් ලද නම් මාගේ අදහස සිද්ධ නො වෙයි" යනුවෙන් සිතා කලින් ම වාසල්දෙර යතුරු ලැවී ය. ඒ මිනිසා ද රජතුමා නාන වේලාවට ම වාසල් දෙර කරා ගොස් දෙර හරවා ගත නොහී මල් හා මැටි උඩළිපත (ඉහළ එළිපත) මත තබා මල් හා අරුණුවන් මැටි ගෙනා බවත් රජු තමා නිකරුණේ මරවන්නට සූදනම් වන බවත් හඬ නඟා කියා භික්ෂූන්ගේ පිහිට පතා විහාරයට ගොස් නිදා ගත්තේ ය.

ඒ රෑ නිදි නො ලැබ ඒ ස්ත්‍රිය ගැන ම නිතර සිහි කරන රජුගේ ගත-සිත දෙක ම දවමින් කාමගින්න දැඩි ව නැඟී සිටි අතර "එළි වූ සැටියේ ඒ මිනිසා මරවා ඔහුගේ අඹුව ගන්නෙමි"යි සිතමින් රජු ඇඳෙහි වැතිර සිටියේ ය. එදින මධ්‍යම රාත්‍රියෙහි, කලකට පෙර ලෝකුඹුනරකයෙහි ඉපිද එහි පැසෙන සත්ත්වයන් සතරදෙනෙක් එම නරකයෙහි මුවවිටට පැමිණ "දු - ස - න - සෝ" යන භයජනක ශබ්දයක් කොට නැවත ලෝකුඹුවෙහි ම වැටුණාහ. රජුට එම හඬ ඇසුණු අතර එයින් තැති ගත් රජු නො නිඳා සිට උදෑසන ම පුරෝහිතබමුණා ගෙන්වා කරුණු විමසී ය. "රජුගේ ජීවිතයට අනතුරක් වන්නේ ය. එයින් මිදීමට ඇත්, අස්, ගොන්, එළු, කුකුළු, කෙලි, කොලු යන මෙවුන් සියය බැගින් ගෙන මරා 'සබ්බසත' යාගය කළ යුතු ය"යි පුරෝහිතයා කීයේ ය. රජතුමාගේ අණින් රාජපුරුෂයෝ සියල්ල සූදනම් කළහ.

මේ කරුණ රජුගෙන් දැන ගත් මල්ලිකා දේවිය "අනිකෙකුගේ මරණයෙන් අනිකෙකුට ජීවිතය ලැබුණු බව ඔබ මෙයට කලින් අසා තිබේ ද? මෝඩ බමුණාගේ බස් ගෙන මිනිසුන්ට දුක් දෙන්නේ කුමක් නිසා ද? අසල වෙහෙරෙහි තුන්කල් දන්නා නුවණ ඇති තිලෝගුරු සම්මාසම්බුදුරජාණන් වහන්සේ වැඩවසන සේක. මෙබඳු යමක් කිරීමට පෙර බුදුරජාණන් වහන්සේගෙන් ඇසිය යුතු නො වේ දැ"යි කී කල්හි රජු මල්ලිකා දේවිය සමඟින් විහාරයට ගියේ ය.

මල්ලිකා දේවිය, මෙම කරුණ බුදුරජාණන් වහන්සේට දැන්වූවා ය. බුදුරජාණන් වහන්සේ "මහරජ බිය වන්නට කරුණක් නො වේ. මෙයින් ඔබට හෝ දේවියට හෝ රාජ්‍යයට හෝ නපුරක් නො වේ. පවු කොට ලොහොකුඹුනරකයෙහි ඉපිද සිටිනා කිහිපදෙනෙක් තමන් විඳින දුක කියන්නට මෙසේ කීහ"යි වදාළ කල්හි රජ තෙමේ "ඔවුන් කළ පව්කම් කුමක් දැ"යි ඇසී ය. එවිට බුදුරජාණන් වහන්සේ "මොවුහු පෙර ආත්මභාවයේ දී පරස්ත්‍රීන් සමඟ වෙසෙමින් රා බොමින්, මස් කමින්, නැටුම්-ගැයුම් කරමින් ජීවත් වී මියගොස් නරකයේ උපන්නාහ"යි පරදාරකමේ විපාක විස්තර කළ සේක.

කොසොල් රජතුමා ද එය අසා 'මෙතැන් පටන් පරදාරකර්මයක නො හැසිරෙමි'යි ඉටා ගත්තේ ය. "ස්වාමීනි**!** රාත්‍රිය දිග බව ඊයේ රෑ දැන ගතිමි"යි බුදුපියාණන් හට රජතුමා කී කල්හි, සේවක තෙමේත් නුදුරෙහි හුන්නේ ඒ කථාව අසා, "ස්වාමීනි**!** යොදුන දුර බව මටත් ඊයේ දැනුනා"යි කීයේ ය.

ඉක්බිති බුදුරජාණන් වහන්සේ දෙදෙනාගේ ම කියුම් ගළපා "එකෙකුට රෑ දිග ය, එකෙකුට යොදුන දිග ය, මෝඩයාට සසර දිග ය"යි "**දීඝා ජාගරතෝ...**" යන ගාථාව වදාළහ. දේශනාව අවසානයෙහි ඒ පුරුෂයා සෝවාන්-ඵලයට පත්විය.

රජතුමා ශාස්තෲන් වහන්සේට වැඳ නික්ම ගොස් යාගයට නියම කොට සිටි සියල්ලන් ම මුදා හැරියේ ය.

**ආත්මෝපදේශය** - නො හික්මුණු සිත මිනිසා නො මඟට යවයි.

සාධු **!** සාධු **!!** සාධු **!!!**

**ශ්‍රී සද්ධර්ම සංසදය**<br>**ධම්මාරාම යෝගාශ්‍රමය**<br>**(වෙසක් 2553)**


**<u>සම්පාදක:</u>** පොල්ගස්ඕවිට විපස්සනා භාවනා මධ්‍යස්ථානවාසි
පූජ්‍ය පිළියන්දල අතුලසිරි ස්වාමීන් වහන්සේ.

**<u>පිටු සැකසීම:</u>** පින්වත් පුණ්‍ය ශ්‍රී තුෂන්ත උපාසක මහතා.

**<u>ධර්මදානය:</u>** පින්වත් ආර්. ඩී. දයාසීලී උපාසිකා මාතාව විසින් අභාවප්‍රාප්ත ආර්. ඩී. ලින්ටන් සොහොයුරාට පුණ්‍යානුමෝදනා කිරීම පිණිසත් උපේක්ෂා පියරංගිකා මෙණෙවිය විසින් දෙමවුපියන්ට ආශීර්වාද පිණිස හා තමාට වහා චතුරාර්යසත්‍යය අවබෝධ කර ගැනීම පිණිසත් මෙම ධර්මදානය සිදු කරන ලදී.


❖ *අතිපූජනීය නා උයනේ අරියධම්ම ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ධර්මදේශනා ඇතුළු පටිගත කරන ලද ධර්මදේශනා සහ පසුගිය දහම්ලිපි* **www.sadaham.net** *යන වෙබ් අඩවිය ඔස්සේ ලබා ගත හැකි ය.*


**Copyright © Sri Saddharma Sansadaya, Dhammarama Yogashramaya - 2009**